# HDFC BANK

දශක තුනකට වැඩි කාලයක් පුරා විවිධ මූල්‍ය විසඳුම් හරහා සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ හිසට සෙවණක් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට මූල්‍ය සහාය සපයමින් දැයේ අභිවෘද්ධිය උදෙසා කැප වන බැංකුවක් සමඟ ඔබේ බැංකුකරණ වෘත්තීය උසස් තලයකට ගෙන ඒමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

**HDFC** බැංකුවෙහි සහකාර සාමාන්‍යාධිකාරී / ප්‍රධාන කළමණාකරු - භාණ්ඩාගාර යන පුරප්පාඩු පිරවීම සඳහා දක්ෂ, ක්‍රියාශීලි සහ සුබවාදී දැක්මක් සහිත අයැදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවන අතර, තෝරා ගැනෙන අයදුම්කරුවන්ගේ පළපුරුද්ද අනුව ඔවුන් සහකාර සාමාන්‍යාධිකාරී හෝ ප්‍රධාන කළමණාකාර තනතුරේ පිහිටුවීමේ හිමිකම බැංකුව සතු වේ.

**සහකාර සාමාන්‍යාධිකාරී / ප්‍රධාන කළමණාකරු - භාණ්ඩාගාර**

මූලික වගකීම්:

- බැංකුවේ භාණ්ඩාගාර ක්‍රියාවලිය හා සම්බන්ධ අවධානම් පිළිබඳ පුරෝකථන සිදු කිරීම, ඒවා කළමනාකරණය කිරීම, ඒවා අවම කිරීම හා බැංකුවේ මූල්‍ය පුරෝකථනවලට අනුකූල වන පරිදි පැහැදිලි හා හොඳින් අර්ථ ගැන්වූ භාණ්ඩාගාර උපාය මාර්ගයක් සකස් කිරීම.
- ව්‍යාපාර මෙහෙයුම් සඳහා කෙටි කාලීන හා දිගු කාලීන අරමුදල් සපයා ගැනීම සඳහා උපාය මාර්ග සහ ක්‍රමවේද සකස් කිරීම.
- පොලී අනුපාත අවදානම්, ද්‍රවශීලතා කළමනාකරණය හා නිසි අරමුදල් සැකසීම් ආවරණය වන පරිදි එදිනෙදා භාණ්ඩාගාර මෙහෙයුම් සකස් කිරීම සහ කළමනාකරණය කිරීම.
- පාරිභෝගිකයන්ගෙන් දිගු කාලීන මූල්‍ය වාසි සඳහා හේතු වන ආයෝජන අවස්ථා ආකර්ෂණය කර ගැනීම.
- ආයතනික මූල්‍යමය තත්ත්වය සම්බන්ධයෙන් වැදගත් වන තීරණයක් ගැනීමේදී අවශ්‍ය අදාළ පසුබිම් පර්යේෂණ පැවැත්වීම සහ වත්කම් හා වගකීම් කමිටුව (ALCO) / අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිඛිත යාවත්කාලීන කිරීම.
- මූල්‍ය හා ආයෝජන ගිවිසුම් පිළිබඳව ප්‍රමාණවත් පරිදි සාකච්ඡා කිරීම, යහපත් අවධානම් කළමනාකරණය සහ වාර්තා කිරීම.
- වත්කම් හා බැරකම් කල් පිරීම් සම්බන්ධ නොගැලපීම් අවම කිරීම සඳහා අදාළ කළමනාකරණ තොරතුරු වත්කම් හා වගකීම් කමිටුවට සැපයීම සහ වර්තමාන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා එම කමිටුවේ රැස්වීම් නිතිපතා කැඳවීම.
- ද්‍රවශීලතා අවධානම් රාමුව විශ්ලේෂණාත්මක වශයෙන් වැඩි දියුණු කිරීම.
- ද්‍රවශීලතාව / මුදල් ප්‍රවාහ කළමනාකරණය හා නිසි අරමුදල් සැකසීම යන අංශ ආවරණය වන පරිදි එදිනෙදා භාණ්ඩාගාර මෙහෙයුම් සංවර්ධනය සහ වැඩි දියුණු කිරීම.
- ණය උපාංග සහ ස්ථානගත කිරීම් පිළිබඳ දැනුම තිබිය යුතු වේ.
- ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සහතික කරමින් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම හා අපේක්ෂිත ලාභය උපරිම මට්ටමකට රැගෙන ඒම සඳහා වෙළෙඳපොළ අවස්ථා ප්‍රාග්ධනය කිරීම. ඒ අනුව මුදල් හා ආයෝජන මෙන්ම බැංකුවේ සමස්ත භාණ්ඩාගාර මෙහෙයුම්වලට අදාළ විවිධ අංශ සඳහා අවධානම් කළමනාකරණ උපාය මාර්ග වැඩි දියුණු කිරීම සහ ක්‍රියාවට නැංවීම  සඳහා වගකිව යුතු වේ. බිල්පත් හා බැඳුම්කර කළඹ නිරාවරණය කිරීම අනිවාර්යයෙන් කළ යුතුය.

සුදුසුකම්:

- පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූල්‍ය කළමනාකරණ / ගිණුම්කරණ උපාධියක් තිබීම.
- පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ.
  - ICASL / ACCA / CIMA / CMA වැනි ආයතන අතරින් එකකින් ලැබූ පූර්ණ වෘත්තීය සුදුසුකමක්.

    සහ /හෝ
  - මූල්‍යකරණය / ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්.

    සහ/හෝ
  - භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳ සුදුසුකම්.

- මුදල් වෙළෙඳපොළ මෙහෙයුම් සහ ණය හා අරමුදල් සපයන ආයතන සමඟ සාකච්ඡා කිරීම පිළිබඳ ප්‍රමාණවත් පළපුරුද්දක් තිබිය යුතු වේ.

  - සහකාර සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරක වසර හයක පළපුරුද්ද ඇතුළු අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද තිබීම.
  - ප්‍රධාන කළමනාකාර තනතුර සඳහා බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක වසර 8කට වඩා වැඩි පළපුරුද්ද තිබීම.

වයස් සීමාව: අවුරුදු 55ට අඩු වීම වඩාත් සුදුසු වේ.

වෙළෙඳපොළ අගයන්ට සමාන වන පරිදි සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට බැර කිරීම් සහිත ආකර්ෂණීය වැටුපක් හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

HDFC බැංකුවේ නිල වෙබ් අඩවිය වන https://www.hdfc.lk හරහා අදාළ අයදුම්පත බාගත (Download) කර ගත හැකිය.

අයදුම්කරුවන් අනිවාර්යයෙන්ම නිර්දේශිත අයදුම්පතට අනුගත විය යුතු අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර අනිකුත් අදාළ ලිපිගොනුද සමඟ 17.01.2024 දින හෝ ඊට පෙර සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ “සහකාර සාමාන්‍යාධිකාරී / ප්‍රධාන කළමණාකරු - භාණ්ඩාගාර තනතුර සඳහා අයදුම්පත” යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට ඉල්ලා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති පුද්ගලයන්ට මෙම තනතුර සඳහා අයදුම් කළ නොහැක. අදාළ සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්ගේ අයදුම්පත්, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබුණු අයදුම්පත් සහ නිර්දේශිත ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලිපිගොනුවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු හේතුවක් මත මෙම තනතුර සඳහා පත් නොකෙරෙනු ඇත.

ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් මෙම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සැළැකේ.

බඳවා ගැනීම් කල් දැමීමට හෝ අවලංගු කිරීමට HDFC බැංකුවට හැකියාවක් ඇත. තෝරා ගත් අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ ක්‍රමවේදයේ ඉදිරි අදියර සඳහා කැඳවනු ඇත.

**සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන**
**HDFC බැංකුව**
**තැ. පෙ. 2085**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත**
**කොළඹ 02**
**දුරකථන අංකය: 0112356800    වෙබ් අඩවිය: www.hdfc.lk**